3 වන පිටුවෙන් (සැමදා ජේ වී පේ ...)

විජේවීර මුදා ගැනීමේ මෙහෙයුමේදී කැලණිය තොරණ හංදියේ පදිංචි වසන්ත නම් අයෙක් පොලිස් වෙඩි පහරින් මිය ගියේය. නන්දන මාරසිංහගේ ද දිවි බේරුනේ අනූ නවයෙනි. තමා බේරාගැනීමට දිවි පරදුවට තබා ආ පුද්ගලයාව මරා දැමීමට විජේවීර ප්‍රමුඛ ජේවීපී ය තීරණය කරයි. මෙම තීරණය ජවිපෙන් ඉවත් කළ හෝ ඉවත් වූවන් සම්බන්ධයෙන් ඔවුන් දක්වන ආකල්පය තේරුම් ගැනීමට ප්‍රමාණවත් වනු ඇත. මේ පිළිබඳ බොහෝ අත්දැකීම් මෙය කියවන ජවිපෙන් ඉවත්වූ හෝ ඉවත් කළ 'ද්‍රෝහී' සොයුරන් වෙත ඇතුවා නිසැකය.

අතීතයේදී ජවිපෙ කැඩුණු අවස්ථා සහ අද ජවිපෙ දෙදරා යෑම අතර විශාල සම්බන්ධයක් ඇත. මෙය හුදෙක් වීරවංශගේ පුද්ගලික කාරණා මත කැඩී වෙන්වීමක් නොවන්නේය. මේ සෑම කැඩී වෙන්වීමකටම ප්‍රධාන මාතෘකාව නම් ජවිපෙ 'සන්නද්ධ වීමේ' ප්‍රශ්නය වේ.

71 දී විශාල පිරිසක් ජවිපෙ හැරයන්නේ සන්නද්ධව කැරැළි ගැසීම හරි සහ වැරදි යැයි මත දෙකක පිහිටීම නිසාය. ඊළඟ අවස්ථාව නම් 83 තහනමින් පසු ලයනල් බෝපගේ ගේ අස්වීමෙන් පසු 'ජවිපෙ නව ප්‍රවණතාවය' ලෙස කණ්ඩායමක් කැඩී වෙන්වීමයි. එම අවස්ථා වේදී ද ප්‍රධාන ගැටළුව වන්නේ තහනම සමග ජවිපෙ තහනම ඉවත් කර ගැනීමට නොයා සන්නද්ධ වීමට තීරණය කිරීමත්, ජාතික ගැටලුව සම්බන්ධයෙන් ජවිපෙ එතෙක් දැරූ මාක්ස්වාදී ස්ථාවරයෙන් පිට පැන ජාතිවාදී ස්ථාවරයක් ගැනීමත්ය.

එහිදී 10 දෙනකුගෙන් යුත් දේශපාලන මණ්ඩලයෙන් 6 දෙනෙක්ම සන්නද්ධ වීමේ තීන්දුවට එරෙහිව ඉවත් වී ගියෝය. ඔවුන් වෙනුවට විජේවීරවාදී අලුත් සාමාජිකයන්ගෙන් දේශපාලන මණ්ඩලය පුරවා ගත් ජවිපෙ අද කියනා පරිදි ඉතිහාසයේ 'නිවැරදීම' තීන්දුව ගෙන නායකයන් සියලු දෙනාමත් සමග සාමාජිකයන් විශාල පිරිසක් රැගෙන නැවත නොඑන ගමන ගියෝය.

'ජවිපෙ යළි සන්නද්ධ වෙයි' නමින් අප පෙර ලියූ ලිපියෙන් හෙළි කළ කාරණා තහවුරු කරමින් මෙවරද ජවිපෙ කැඩී යන්නේ මෙම සන්නද්ධ වීමේ ක්‍රියා මාර්ගය නිසාමය.

ජවිපෙ නායකයන් දැන හෝ නොදැන ඔවුන්ගේ අද පවතින ප්‍රධාන අර්බුදය නම්, මේ පක්ෂය තියෙන්නේ කුමකටද? යන්නයි. මෙය පවත්වාගෙන යන්නේ විප්ලවයකින් පසු සමාජවාදය පිහිටුවීමටද? ඒ වසර හැත්තෑ ගණනක් ලෝකය අත්හදා බලා අතහැර දැමූ සමාජවාදයමද? සමාජවාදී විප්ලවය කරන්නට සිටී නම් කමක් නැත. මන්ද අනෙක් කිසිදු පක්ෂයක් එය කිරීමට පෙනී නොසිටින නිසා ඒ වෙනුවෙන් ජවිපෙ තිබුණාට ප්‍රශ්නයක් නැත. එසේනම් ගොඩනගන්නේ කුමන සමාජවාදයද? චීනයේ එකද? කියුබාවේ එකද? චාවේස්ගේ එකද? නැතිනම් ලංකාවට සුවිශේෂී වූ අලුත්ම එකක් ද? ඒ පිළිබඳ නිශ්චිත වශයෙන් ඔවුහු කිසිත් නොකියති.

නොඑසේ නම් ජවිපෙ පවත්වාගෙන යන්නේ දියුණු කළමණාකාරීත්වයකින් යුත්, දූෂණ අවම කරගත් නවීන ධනවාදය වෙනුවෙන්ද? එසේ නම් එය ඉටු කිරීමට ජවිපෙට වඩා අත්දැකීම් බහුල ධනවාදය වෙනුවෙන් පෙනී සිටින පක්ෂ ලංකාවේ තිබේ.

එසේත් නැතිනම් ජවිපෙ පවත්වාගෙන යන්නේ එල්ටීටීඊ ත්‍රස්තවාදය පරදවා ඒකීය රටක් හැදීමටද? එසේ නම් ඒ සඳහා මහින්ද රාජපක්ෂ, සරත් ෆොන්සේකා, ප්‍රමුඛ ත්‍රස්තවාදය සමග වසර 30 ක් යුද කිරීමෙන් ලත් ලොව හොඳම අත්දැකීම් සහිත ත්‍රිවිධ හමුදාවක් තිබේ.

එසේත් නැතිනම් ධනපති ආණ්ඩු වෙත 'පීඩන කණ්ඩායමක්' ලෙස කටයුතු කර ජනතාවගේ ජීවන බර අඩු කරලීමට උදව් කරනා පක්ෂයක් ලෙස කටයුතු කිරීමටද? එවැන්නක් කරන බවක් නොපෙනෙන්නේ පසුගියදා ජීවන බර වැඩි කරන අති අසාර්ථක අයවැයක් පැරදවීමට ජවිපෙ ක්‍රියා නොකර කට්ටි පැනීම නිසාය.
මේ ආදී කාරණා සලකා බැලූවිට මේ පක්ෂය තියාගෙන ඉන්නේ ඇයි? ඊළඟට කරන්නේ කුමක්ද? ජවිපෙ දෙදරා යෑමේ අර්බුදයේ මූලයද මෙයයි.

ලඟ එන මැතිවරණයේදී ලබන අන්ත පරාජයේ හඳ ගැස්ම දැනෙනා ජවිපෙ නව තීරණයක් ගත යුතුය. නන්දනලා, අමරසිංහලා, විමල්ලා, විජේනායකලා, ජාගොඩලා කියන්නේ ඒ කථාවයි. එනම් දියුණු ධනේෂ්වර රාජ්‍යයක් කරා ලංකාවට ළඟාවීමට නොහැකි වී ඇත්තේ රාජ්‍ය දූෂණයත්, ගජ මිතුරු ඥාති සංග්‍රයත්, අසාර්ථක මූල්‍ය කළමණාකරණයත්, සැලසුම් සහගත සංවර්ධනයත් පිළිබඳ ප්‍රධාන පක්ෂ දෙකේම පවත්නා අසාර්ථක භාවය නිසා යැයි කියන ඔවුහු ඊට පිළියම් සඳහා ජවිපෙ සූදානම් කළ යුතුයැයි කියති. ඔවුහු පවතින යුද්ධයද අනුමත කරති.

කුමාර් මහත්තයා, සෝමවංශ, ලාල්කාන්ත, විජිත හේරත්, අනුර දිසානයක, ටිල්වින් ආදීන් සිටින්නේ, යුද්ධය විසින් ලංකාවට එක්සත් ජාතීන්ගේ හමුදාවක් එවීමේ වෑයමක් පවතින අතර, එවිට රජයේ හමුදා ඊට ඉඩදී සිටිනු නොඅනුමානය යන මතයේය. එවිට තමන්ට සන්නද්ධවී ඊට එරෙහිව ගෙන යන අරගලයකින් බලය අල්ලා ගත හැකි යැයි සිතා ඊට පක්ෂය සූදානම් කිරීමේ වෑයමෙහිය.

සාමාජිකයින් ඇන්දවීමට ජවිපෙ ට හැමදාම බිල්ලෙකු අවශ්‍යය. 71 බිල්ලා ඇමරිකානු සීඅයිඒ කුමන්ත්‍රණයයි, 89 දී ඉන්දියානු වඳුරු හමුදා ආක්‍රමණයයි, 2008 දී එය එක්සත් ජාතීන්ගේ හමුදාවක් ලංකාවට පැමිණීම වනු ඇත.

අප පෙර ලිපියකදී 'ජවිපෙ සන්නද්ධ වෙනවා' යැයි කියද්දී විරු සමරු රැළියේදී සෝමවංශ එය ප්‍රතික්ෂේප නොකරයි. විදේශ හමුදාවක් පැමිණි විට ජවිපෙ සන්නද්ධ කර හමුදා සමග එක්ව ඊට එරෙහිව යුද කරන බවට ඔහු කරනා ප්‍රකාශයෙන් අපගේ හෙළිදරව්ව සනාථ වෙයි.

අනෙක් අතින් සෝමවංශගේ කථාවේදී පිටුපසින් කරනා පිහි ඇනුමකින් තමන් මිය ගියහොත් එය පක්ෂය ඇතුළේ වැඩක් බව කියද්දී, වීරවංශ 'මට වෙඩි තිබ්බේ ඇයි දැයි' අසයි.

මෙහි යටි පෙළ නම් වීරවංශ පිළේ ඇත්තේ පිහි පමණක් වුව ද සෝමවංශලා ගේ, කුමාරලාගේ පිලේ තුවක්කු තිබෙන බව නොවේද?

පසුගියදා වීරවංශ පිලට ගිය පුත්තලම ජවිපෙ මන්ත්‍රී සමන්සිරිගේ වාහනය රැගෙන යාමට සන්නද්ධ 25 ක් පැමිණි අතර ඔවුන් ආරක්ෂක පොලිස් භටයන්ගේ ගිනි අවිවල පතරොම් කොපු දෙක ගෙන යන්නේ ඇයි? පතරොම් පමණක් අවශ්‍ය වන්නේ තමන් ලඟ ගිනි අවි තිබෙනවා නම් පමණයි.

කෙසේ වෙතත් අප වෙත ලැබී ඇති ආරංචි මාර්ග අනුව නම් ජවිපෙ කණ්ඩායම් දෙකම ශක්තිමත්ය. එම නිසාම එකිනෙකාට විරුද්ධව එල්ල කරනා ප්‍රහාරයන්ද ශක්තිමත් වනු ඇත.

ජවිපෙන් මෙවර ඉවත් වූ විමල් වීරවංශ යනු පක්ෂයේ තරුවයි. 84 දී බෝපගේ ගේ ඉවත් වීමේදී බෝපගේ ශක්තිමත් වුවද එදා පුද්ගලික රූපවාහිනි නාලිකා තිබුනේ නැත. රූපවාහිනී සාකච්ඡා තිබුණේ නැත. රූපවාහිනිය හරහා දේශපාලන තරු බිහිව තිබුණේ නැත.
තරු වටා රැස්වූ ලක්ෂ ගණනින් මනාප දුන් ජනතාවක් සිටියේ නැත.

වීරවංශ පාර්ලිමේන්තුවේදී කථා කළේ සිය පක්ෂයේ කේඩරයට නොවේ. ඔහුට බැඳුණු සාමාන්‍ය ජනතාවගේ අනුකම්පාව සඳහා ය. ඔහු සංවේදී කතාවක් කරන්නේ මේ නව තත්ත්වය තේරුම් ගෙන විය යුතුය. තරුවක් ලෙස වීරවංශ ද නිකම්ම නිවී යන්නට සූදානම් නොවන බව පෙනේ. කවුරුන් වෙන් වුවත් ජවිපෙට කිසි හානියක් නොවන බවට සෝමවංශලා නගන අඬහැරය එතරම් ම ප්‍රායෝගික නොවන්නේ, මෙතෙක් එසේ වෙන්වීම් සිදුවෙද්දී ජවිපෙ 'අනුහස් සහිත නායකයා' ලෙස විජේවීර සිටි බැවිනි. අද එවැන්නෙක් නැත. සෝමවංශ යනු දුර්වල විහිලුකාරයෙකි. බොහෝ දෙනාගේ ජනප්‍රියත්වය හිමිව තිබූ නායකයා වීරවංශය. ඒ අතින් ගත් කලද මෙවර ජවිපෙ පුපුරා යෑම. ජවිපෙට ඉතා නරක ලෙස බලපානු ඇත. එබැවින් වාහන පැහැර ගැනීම, මරණ තර්ජන ආදියෙන් ආරම්භය වූ ගැටුම බිහිසුණු ඝාතන රාශියකින් කෙළවර වනු අතැයි අනුමාන කළ හැකිය. මෙවර පළමුවැනි 'දයා පතිරණ' වන්නේ කවුරුන්දැයි දැන ගැනීම අනාගතයට බාර ය.

*(අනුග්‍රහය - ලංකා ඊ නිව්ස්)*

